# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1912/33 - 2015 අප්‍රේල් මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2015.04.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත**

උතුරු පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩු පිරවීම

උතුරු පළාතේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු මිය යාම හේතු කොට ගෙන එම පළාත් සභාවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65(1) වැනි වගන්තිය යටතේ උතුරු පළාතේ පළාත් සභාවේ ලේකම්වරයා විසින් මා වෙත දන්වා තිබෙන හෙයින් ද ;

එකී පුරප්පාඩුව පුරවනු පිණිස තෝරා පත් කර ගත් මන්ත්‍රීවරයා අයත්ව සිටි පිළිගත් දේශපාලන පක්ෂය වන ඉලංකෙයි තමිල් අරසු කච්චි පක්ෂයේ ලේකම්වරයාට ඉහත කී පනතේ 65(2) වැනි වගන්තිය යටතේ සුදුසුකම් ඇති තැනැත්තෙකු නාමයෝජනා කරන ලෙස, ම විසින් නියම කර ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එකී පුරප්පාඩුව පුරවනු පිණිස නිශ්චිත කාල පරිච්ඡේදය ඇතුළත නාමයෝජනා නොකරනු ලැබ ඇති හෙයින් ද ;

මැතිවරණ කොමසාරිස් වඩුගේ වරුණසිරි මහින්ද දේශප්‍රිය වන මම, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, 2013 සැප්තැම්බර් මස 21 වන දින උතුරු පළාතේ පළාත් සභාව සඳහා පැවැත්වූ ඡන්ද විමසීමේදී තෝරා පත් කර ගත් අවසාන මන්ත්‍රීවරයා ළඟට වැඩිම මනාප සංඛ්‍යාව ලබා ගත් කන්දයියා සිවනේසන් මහතා එම පුරප්පාඩුව සිදුවූ මුලතිව් පරිපාලන දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් පළාත් සභාවේ මන්ත්‍රීවරයා ලෙස තේරී පත්වී ඇති බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2015 අප්‍රේල් මස 29 වැනි දින,
මැතිවරණ මහ ලේකම් කාර්යාලය,
රාජගිරිය.

05 - 379

1A - G 21470 — 26 (2015/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*